رسالة توعية مائية
لعاملات المنازل
باللغة السيريلانكية

# මියහුනා

## මියහුනා ජෝර්දාන් ජල සමාගමෙන් මේ පණිවුඩය ජෝර්දානයේ ගෘහ සේවිකා අමුත්තන් වෙතයි.

ජෝර්දාන් ජල සමාගම "මියහුනා" හා එක්ව ජෝර්දාන් නොවන ගෘහ සේවිකාවන් මෙරටට සැපයිමට දායක වන රැකියා නියෝජිත සංගමය, දෙවැනි මව් බිමට පැමිණි අපගේ ගෘහ සේවිකා අමුත්තන් සාදරයෙන් පිලිගන්නා අතර ඔබ හැම ජෝර්දානියන් සමග උරෙනුර ගැටී මෙරටට කරනු ලබන සේවය අපි අතිශයින් අගය කරමු.

ජෝර්දානයේ අගනුවර වන අම්මාන් නගරයට ජලය සැපයි හා අපිරිසිදු ජලය ඉවත් කිරිම භාරව සිටින "මියහුනා" ජෝර්දාන් ජල සමාගම ජලය අපතේ නොයවා හොඳින් පාවිච්චි කිරිම හා සුරැකිම සඳහා යම් උපදෙසක් ඉදිරිපත් කිරිමට කැමැත්තෙන් සිටී.

ඇති තරම් වර්ෂාපතනයක් ඇති හා ගංගා ජල උල්පත් වලින් පිරුනු උණුසුම් රටවල් වල සිට ගංගා හෝ ජලාශ නොමැති, සතියකට එක් වතාවක් පමණක් නිවෙස්වලට ජලය ලබාදෙන උග්‍ර ජල හිගයකින් පෙලෙන මෙරටට ඔබ හැම රැකියාව සඳහා පැමිණ සිටින බව අපගේ ජල සමාගම අවබෝධ කරගෙන සිටිනවා.

ජලය අනවශ්‍ය ලෙස අපතේ යැවීම නිසා නිවසේ ජල ටැංකිවල රැස් කර ඇති ජලය නිරන්තරයෙන්ම හිඟ වීම සිදුවන අතර මේ නිසා නිවැසියන් ඉමහත් අපහසුවට පත්වන අතර ගෙහිමියන්ට අමතරව ජලය මිලදී ගැනීමටද සිදුවේ. මෙය ගෙහිමියාට මෙන්ම මුළු රටටම දරාගත නොහැකි විශාල වියදමකි.

මේ නිසා ජලය සුරක්ෂිතව ප්‍රයෝජනයට ගැනීම සඳහා පහත සඳහන් උපදෙස් පිලිපදිමින් අපට සහයෝගය දෙනු ඇතැයි අප ජල සමාගම උදක්ම අපේක්ෂා කරයි.

1. භාජන හා වෙනත් දෑ සෝදන විට නිරන්තරයෙන්ම ජල කරාම විවෘත කොට නොතබන්න.
2. එළවළු හා පළතුරු ආහාරයට ගැනීමට පළමු ජල කරාමයෙන් ලැබෙන ජලයෙන් නොසෝදා ලොකු බේසමකට වතුර එකතු කොට ඉන් සෝදන්න. එවිට එම ජලය ගෙවත්තේ පැලෑටි හා ගස් වලට දැමිය හැකි වනු ඇත.
3. ජලය කාන්දුවීම වැලැක්වීම සඳහා සේදීමේ කටයුතු නිමවූ වහාම ජල කරාම තදින් වසා තබන්න.
4. ජල නල යොදා මෝටර් රථය සේදීම වෙනුවට ඒ සඳහා භාජනයක් පාවිච්චි කරන්න.
5. සේදියයුතු ඇඳුම් ප්‍රමාණය මුළුමනින් ඇතුලත් කල පසු පමණක් රෙදි සේදීමේ යන්ත්‍රය ක්‍රියාත්මක කල යුතු වේ.
6. ගෙවත්තට ජලය දැමීමේදී ගෙවතු වලට ජලය සැපයීම සඳහා නිපදවා ඇති උපකරණය යොදා ගන්න. තවද ජලය වාෂ්ප වීම අවම කිරිම සඳහා ගස් හෝ පැලෑටි වටා වතුර දැමිය යුත්තේ උදෑසන හෝ සැන්දෑවේය.
7. වතුර නලයකින් විදිමෙන් නිවෙසේ එලිවත්ත හා නිවසක වටා ඇති සිමෙන්තියෙන් තැනූ කොටස් සේදීමෙන් වලකින්න. ඒ වෙනුවට එම කොටස් කොස්සකින් අතුගා හොඳින් පිරිසිදු කරන්න.

සෑම ජල බින්දුවක්ම සුරැකිම සඳහා කැපවීම යහපත් ගුණාංගයකි, තමන් අදහන ආගමට ගරුකිරිමකි.

මෙම ජාතික සම්පත සුරැකිම සඳහා අපේ කොටස්කරුවන් වනු මැනවි.



**MIYAHUNA HOT DIRECT LINE**

For water & Wastewater complaints :

**5679141**

24 hours daily | 7 days a week